# සෙල්ලම් ගෙදර



මෙතුලි තස්නිකා කරුණාරත්න

# සෙල්ලම් ගෙදර

මෙතුලි තස්නිකා කරුණාරත්න

# සෙල්ලම් ගෙදර

මෙතුලි තස්නිකා කරුණාරත්න

| | | |
|---|---|---|
| ලිපිනය | : | නො: 65/64,<br>හේවාහැට පාර,<br>තල්වත්ත,<br>මහනුවර. |

| | | |
|---|---|---|
| කර්තෘගේ වෙනත් කෘති | : | දඟකාර අලි පැටියා<br>සිංදුයි බිංදුයි<br>පුංචි කුරුළු පවුල |

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | 2023-11-15 |

ISBN : 978-624-206-825-1

# ~ පිදුම ~

මගේ ආදරණීය සමන්මලී ගුරුතුමියට

හා

මගේ පංතියේ සිටින සියළුම යෙහෙළියන්ට

ආදරයෙන් පුදමි.

# ~ ස්තූතිය ~

මෙම පොත ලිවීමට

මට උදව් කළ හැම දෙනාටම

ස්තූතියි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිටවිවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පසාල් කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


2023.11.01

ලස්සන පුංචි ගමක යාළුවෝ හයදෙනෙක් හිටියා. එයාලාගේ නම් තමයි පවනි, කසුන්, දිනිති, කසුනි, කමල්, රුවන් මෙයාලා හරිම හොඳ යාළුවෝ කවදාවත් තරහ වුණෝ නෑ. එයාලා එකම ඉස්කෝලේ එකම පන්තියේ ඒ වගේම එයාලගේ ගෙවලුත් එක ළඟ නිසා හවසට සෙල්ලම් කරනවා. යාළුවෝ හයදෙනා එකට සෙල්ලම් කරනවා. මේ යාළුවෝ හරිම සතුටින් තමයි කාලය ගත කලේ.



දවසක් දා යාළුවෝ ටික ඉස්කෝලේ ගියා. එදා ඉස්කෝලේ නිවාඩු දෙන දවස මෙයාලට ගොඩක් සතුටුයි.




පවනි :- යේ මේ පාර අපි ගොඩක් සෙල්ලම් කරමු

කසුනි :- හා ඒක නම් හොඳයි

නිවාඩුවට අපට ගොඩක් විනෝද වෙන්න පුළුවන් යාළුවෝ හැමෝම කිව්වා.



නිවාඩුව ආරම්භ වුණා. දවසක් යාළුවෝ ටික කසුන්ලගෙ ගෙදරදී එකට හමුවුණා.



| | | |
|---|---|---|
| පවනි | :- | කොහොමද ඔයාලා හොඳින් ඉන්නවා නේද? |
| රුවන් | :- | ඔව් යාළුවේ |
| දිනිති | :- | මේ දැන් නිවාඩු කාලේ පටන් ගත්තානේ අපි මොකක්ද කරන සෙල්ලම |
| කමල් | :- | මොකක්ද කරන්නේ ?... |
| කසුනි | :- | ම්ම්ම්. |
| කසුන් | :- | මොකක්ද කරන්නේ ?... |




පවනි :- මතක් වුණා. අපි සෙල්ලම් ගෙයක් හදමු

දිනිති :- අපි ලී කෑලි එකතු කරලා සෙල්ලම් ගෙදර හදලා රෙදි වලින් වට කරමු. ඊට පස්සේ මල් වලින් ලස්සන කරමු.

පවනි :- හා ...

කමල් :- හා ...



පවනි :- මම ලී ගේන්නම්

කමල් :- මම රෙදි ගේන්නම්


දිනිති :- මම මල් ගේන්නම්

කසුන් :- හා හොඳයි

කසුනි :- හා....



මෙයාලා එකතු වෙලා ලී වලින් සෙල්ලම් ගෙදර හදලා රේදි දාලා වට කරලා මල් වලින් සැරසුවා. සෙල්ලම් ගෙදර හදලා ඉවරයි. යාළුවන්ට හරිම සතුටුයි.



ඊළඟ දවසේ උදේම යාළුවෝ සෙල්ලම් ගෙදරට ආවා. පවනි සෙල්ලම් බත් හදන්න බඩු ගෙනාවා. අපි එකතු වෙලා හරිම සතුටින් සෙල්ලම් බත් හැදුවා. පවනිට හරි සතුටුයි. ඒ වගේම තව ගොඩක් සෙල්ලම් කලා. එයාලා හරිම සතුටින් තමයි හිටියේ ඉතින් මේ සෙල්ලම් ගෙදර සෙල්ලම් එක්ක යාළුවෝ හය දෙනා හරිම සතුටින් නිවාඩු කාලය ගත කළා.



ඉස්කෝලේ ආයෙම පටන් ගත්තම ගුරුතුමියත් එක්ක නිවාඩු කාලය ගත කළ හැටි කියලා සතුටු වුණා. (අපිත් එකමුතු හොඳ යාළුවෝ වෙමු)



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයටපෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනාකරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟිම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතින් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක<br>
2023.11.01